සමගි ජන බලවේගය
ஐக்கிய மக்கள் சக்தி • Samagi Jana Balawegaya

අංක 592, බංගලා හන්දිය,
කෝට්ටේ පාර, පිටකෝට්ටේ.
0112 870 211
0112 870 212
info@sjb.lk

26.12.2024

# මාධ්‍ය නිවේදනය

රජයේ සහ පළාත් සභා ක්ෂේත්‍ර ගණනාවක නියුක්ත රාජ්‍ය නිලධාරීන් සඳහා පිළිගත නොහැකි තර්කානුකූල නොවන පදනමකින් සේවා ස්ථාන මාරු කිරීමේ සැලසුම් සහගත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන බව දක්නට ලැබේ.

පළාත් පාලන සහකර කොමසාරිස්වරු, පළාත් පාලන ආයතන ලේකම්වරුන් මෙන් ම සමූපකාර සහකාර සංවර්ධන කොමසාරිස් වැනි මාණ්ඩලික මෙන් ම ක්ෂේත්‍ර නිලධාරීන් ට ද මෙය බලපෑ ඇති බව වාර්තා වේ. රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය තහවුරු කිරීමට කටයුතු කරනවා යැයි පොරොන්දුවක් ලබාදෙමින් බලයට පැමිණි ආණ්ඩුව මෙලෙස කටයුතු කිරීම ගැටළු සහගතය.

තවමත් අවසන් නැති හා නුදුරේම පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණය හා මේ දිනවල පැවැත්වෙන සමූපකාර සංගම් ඡන්ද විමසීම් හේතුවෙන් පෙර නොවූ විරූ අයුරින් රාජ්‍ය සේවය තුළ සීඝ්‍ර ලෙස දේශපාලනිකරණය වීමක් සිදුවෙමින් පැවතීම, ඉදිරි මැතිවරණ ඉලක්ක කොටගත් වැඩපිළිවෙළක් ලෙස ආණ්ඩුව ක්‍රියාත්මක කරන බව පැහැදිලිවම දක්නට ලැබේ. මෙම මාරු කිරීම් තුළ ඒ ඒ ක්ෂේත්‍රයේ සේවාවන් ඉටුකිරීම් පිළිබඳව ගැටලුකාරී තත්ත්වයක් උද්ගතවනවා පමණක් නොව එම නිලධාරීන්ටද පෞද්ගලිකව බොහෝ ගැටලුවලට මුහුණදීමට සිදුවන බව පෙනේ.

මේ පිළිබඳව සමගි ජන බලවේගය අවධානය යොමුව ඇති අතර එවැනි සිදුවීම් පිළිබඳව සොයා බැලීම සඳහා විශේෂ ඒකකයක් පිහිටුවීමටද කටයුතු කෙරේ. ඒ සඳහා නාමික හෝ නිර්නාමිකව තොරතුරු ලබාදීමට ඕනෑම අයකුට අවස්ථාව සැලසේ. රාජ්‍ය සේවයේ මාරුවීම් සිදුවිය යුත්තක් වන නමුත් එය සැඟවුණු න්‍යාය පත්‍රයකට අනුකූලව සිදුවන්නේ නම් එය පිළිබඳව කටයුතු කිරීම විපක්ෂය වගකීමකි. එමෙන්ම රජය සහ පළාත් සභා මට්ටමින් අත්තනෝමතික සිදු කරනු ලබන සියලුම මාරු කිරීම් අත්හිටුවන ලෙස අපි ආණ්ඩුවට සහ පළාත් බලධාරීන්ට අවධාරණය කරමු.

**රංජිත් මද්දුම බණ්ඩාර (පා.ම)**
මහලේකම්,
සමගි ජන බලවේගය